## මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරී III ශ්‍රේණිය සඳහා වන විවෘත බඳවා ගැනීම - 2024

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි ජනපද නිලධාරී III වන ශ්‍රේණියේ තනතුරට අදාළ පුරප්පාඩු පිරවීම සඳහා මධ්‍යම පළාත තුළ පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයැදුම්පත් කැඳවනු ලැබේ.

**02. වැටුප් පරිමාණය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි MN 03 – 2016 අනුව මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි ජනපද නිලධාරී III ශ්‍රේණියට හිමි මාසික වැටුප් පරිමාණය රු. 31,040 – 10X445 – 11X660 – 10X730 – 10X750 – 57550/- වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**03. සේවා කොන්දේසි**

3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය.

3.2 මෙම තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ඇත.

3.3 තනතුරට බඳවා ගැනීමෙන් පසු මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරී තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ දැක්වෙන ආකාරයට අදාළ කාර්යක්ෂමතා කඩඉම් හා රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගවලින් සමත්විය යුතුය.

3.4 මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05ක අවම සේවා කාලයක් අනිවාර්යෙන් සේවය කළයුතු අතර, එම කාලය තුලදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ. තවද, පත් කරනු ලබන සේවා ස්ථානයේ වැඩ භාරගත් දින සිට අවුරුදු 03ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය.

3.5 මෙම තනතුරට බඳවා ගැනීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට, මධ්‍යම පළාත් මූල්‍ය රීති සංග්‍රහයට, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලටද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලටද අනුව කටයුතු කළ යුතුය.

**04. පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන්**

4.1 මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරී III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු 04ක් සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.2 අයැදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2025.01.10 දින වේ. අයැදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් 2025.01.10. දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

## 05. සුදුසුකම්

### 5.1 අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගයේ කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන විෂයන්ගෙන් විෂයන් 02ක් ඇතුළුව විද්‍යා විෂයන් 03කින් එකවර සමත්වීම.(සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගයේ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයන් දෙක (02) සහිතව විෂයන් තුනකින් එකවර සමත්ව තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය හා තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.

### 5.2 වෘත්තීය සුදුසුකම්

I. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා හය (N.V.Q.6) මට්ටමේ කුසලතා සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

හෝ

II. කුණ්ඩසාලේ, අඟුණකොලපැලැස්ස, පැල්වැහැර, බිබිල, ලබුදූව , වාරියපොල, වව්නියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

III. හාඩි කාර්මික ආයතනයෙන් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

IV. ඇක්වයිනාස් විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

V. රජය විසින් අනුමත ආයතනයක් මඟින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

### 05.3 කායික සුදුසුකම්

සෑම අයදුම්කරුවෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

### 05.4 වෙනත් සුදුසුකම්

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි.
II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.
III. අයැදුම්පත් භාරගන්නා අවසාන දිනට (2025.01.10) පූර්වාසන්නයෙන් වූ වසර 03ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. (අයදුම්කරු මෙම පළාතේ වසර 03කට වඩා ස්ථිර පදිංචි අයෙකු සමඟ විවාහ වූ විට කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සලකා බැලේ.)
IV. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුරුවලට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් නොලබයි.
V. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව 2025.01.10 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

## 06. වයස් සීමාව

අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2025.01.10) වයස අවුරුදු 18ට නොඅඩු සහ සහ අවුරුදු 30ට නොවැඩි විය යුතුය. (දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ට මෙම උපරිම වයස් සීමාව බලපවත්වනු නොලැබේ.)

## 07. විභාගය පිළිබඳ විස්තර

I. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයැදුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.
II. අපේක්ෂකයා විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
III. විභාගය පැවැත්වීමට හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.
IV. විභාග මධ්‍යස්ථානය - මහනුවරදී පමණක් පවත්වනු ලැබේ.

## 08. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40% |

| ප්‍රශ්ණ පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය , විනිශ්චය කිරීම සඳහා වු ප්‍රශ්නවලින් යුක්තය. |
| විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | I.ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය<br>a) දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය<br>b) රැකියා නියුක්තිය<br>c) කෘෂිකර්මාන්තයේ ආනයන අපනයන තත්ත්වය<br><br>II.ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම<br><br>III.පස සහ ශාක පෝෂණය<br>a) පසේ ව්‍යුහය හා වයනය, භෞතික හා රසායනික ලවණතාවය හා බෝග වගාව කෙරෙහි එහි බලපෑම<br>b) ශාක පෝෂණය, පාංශු ශාක පෝෂණ කළමනාකරණය<br>c) පැළෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු<br><br>IV. පාංශු රසායනය , පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම<br><br>V. වාරි මාර්ග ක්‍රම හා ජල කළමනාකරණය.<br>a) විවිධ බෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය<br>b) ක්ෂුද්‍ර ජල කළමනාකරණ ක්‍රම<br>c) ජල වහනය හා එහි වැදගත්කම |

VI.ශ්‍රී ලංකාවේ ජනපද ව්‍යාපාරය හා මහවැලි ව්‍යාපාරය පිළිබඳ දැනුම

a) ජනපද ව්‍යාපාරය පිහිටුවා ඇති ස්ථාන
b) මහවැලි ව්‍යාපාරයට අයත්වන ප්‍රදේශ

VII. ඉඩම් පරිහරණ සැළසුම් සකස් කිරීම පිළිබඳ දැනුම

VIII. සිතියම් ආශ්‍රිත කරුණු පිළිබඳ දැනුම

a) අනිලමානය, ඩම්පිලෙවලය, තියෝඩර්ලයිටරය (විකෝණමානය)
b) 1:50,000 , 1:10,000 ,අහලේ සිතියම් හා අවසාන ගම් පිඹුර පිළිබඳ විස්තර

IX. ශ්‍රී ලංකාවේ දැනට පවතින ඉඩම් පිළිබඳ හා ඒ සම්බන්ධ දෙපාර්තමේන්තු , ආයතන පිළිබඳ දැනුම

ඉඩම් වර්ග - රජයේ ඉඩම්
පුද්ගලික ඉඩම්
ප්‍රවේණි ඉඩම්

X. ඉඩම් සංවර්ධනය හා බෙදාදීම පිළිබඳ දැනුම

a. වර්තමානයේ ඉඩම් සංවර්ධනය හා බෙදාදීම පිළිබඳ ක්‍රියාත්මක ජාතික වැඩසටහන් පිළිබඳ අවබෝධය

- ඉඩම් නොමැති පුද්ගලයින් හඳුනා ගැනීම
- බිම් සවිය වැඩසටහන
- ඉඩම් කැබලි ලක්ෂයේ වැඩසටහන

XI.රජ සමයේ සිට මේ දක්වා ඉඩම්වල අයිතිය බැහැර කිරීමට යොදාගත් ලේඛන පිළිබඳ අවබෝධය

a. සන්නස්, නින්දගම්, බද්දකර, ස්වර්ණ භූමි, ජය භූමි, රත්න භූමි , රන්බිම

**09. අයැදුම්කළ යුතු ක්‍රමය**

I. අයැදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිත කරමින් A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත්අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 04 තෙක් පළමු පිටුවටද, අංක 05 සිට 07 තෙක් දෙවන පිටුවටද, අංක 08 සිට 12 තෙක් තෙවන පිටුවටද, ඉතිරිය සිවුවන පිටුවටද, වන සේ සකස් කළ යුතුය. සම්පූර්ණ කරනු ලබන අයැදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයැදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අයැදුම්පත්‍ර , අසම්පූර්ණ තත්වයේ පවතින අයැදුම්පත්‍ර සහ නිවේදනයේ සඳහන් පරිදි මූලික සුදුසුකම් නොමැති බව අයැදුම්පත්‍රයේ තොරතුරු අනුව පෙනී යන්නේ නම් ද කිසිදු දැනුම්දීමකින් තොරව එම අයැදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයැදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයැදුම්කරුවන් විසින් දරා ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයැදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

II. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.

III. සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් මධ්‍යම පළාත් සභාවට ගෙවිය යුතුය. විභාග ගාස්තුව රු.600/-කි. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා, ඒ සඳහා ලබාගත් නිල් පැහැති ලදුපතක් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. වෙනත් ශීර්ෂයකට ගෙවීම් කරන ලද කුවිතාන්සි හෝ මධ්‍යම රජයට අයත් කහ පැහැති කුවිතාන්සි අලවා ඇතොත් එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එකී ලදුපත නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර විභාගය සඳහා ගෙවන ලද විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත හෝ ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

IV. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ශ්‍රේණිගත කිරීමට අනුව තෘතීය හෝ ජ්‍යෂ්ඨ මට්ටමේ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිළධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

V. අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට **2025.01.10** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **'ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර '** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි ජනපද නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීම - 2024)"** යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ. අයදුම්කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසු ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

VI. අයදුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

VII. අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

VIII. දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

IX. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විසින් මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව අදාල සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැතිබව අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

X. විභාග මධ්‍යස්ථානය පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍රය මඟින් දැනුම් දෙනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** මඟින් පළකරනු ඇත. ප්‍රවේශපත්‍ර විභාගය පැවැත්වීමට දින 14කට පෙර අයදුම්කරුවන්ගේ අයදුම්පතෙහි සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපෑල මඟින් හෝ අයදුම්කරු විසින් අයදුම්පතෙහි දක්වා ඇති ජංගම දුරකථනය වෙත කෙටි පණිවිඩයක් (SMS) මඟින් යොමු කරනු ලැබේ.

XI. නිවේදනය පළ වී දින 04ක් 05ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය. - දුරකථන අංකය 081 - 2213097

10. අදාළ විභාග ගාස්තු ගෙවා, නිසි ලෙස අයදුම්පත්‍ර සම්පූර්ණ කර , නියමිත දිනට පෙර එවා ඇති සියලුම අයැම්කරුවන් වෙත මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර පළමුවෙන්ම විභාගයට පෙනී සිටින දින විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

11. විභාගයට පෙනී සිටින සියලුම විභාග අපේක්ෂකයන් තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේදී පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

12. **අපේක්ෂකයාගේ අනන්‍යතාවය**

මෙම විභාගයට අයත් සෑම විෂය පරීක්ෂණයකදීම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් තම අනන්‍යතාව ඔප්පු කර සිටීමට අයදුම්කරුවන් ක්‍රියා කල යුතුය. මේ සඳහා පහත දැක්වෙන කවර හෝ එක ලියවිල්ලක් ප්‍රමාණවත් වේ.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
- වලංගු රියදුරු බලපත්‍රය.
- වලංගු විදේශ ගමන් බලපත්‍රය.
- එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව කහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුලත් කරගනු නොගැනේ.
- තවද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

13. **සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම**

13.1. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුවද ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

13.2. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලෙකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව අනාවරණය වුවහොත් හෝ ඔහු /ඇය වෙත තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහකිරීමට වුවද යටත් වේ.

14. මෙම විභාගයෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** මඟින් පළ කරනු ඇත.

15. මෙම නිවේදනයේ ආවරණය වන / නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද මෙම විභාගය පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

16. මෙම බඳවා ගැනීම සම්බන්ධ වැඩිදුර විස්තර මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** හි පළකර ඇති අතර අදාළ අයදුම්පත්‍රයද එහිදී භාගත කරගැනිමට හැකි බවද කාරුණිකව දන්වමි.

17. මෙම නිවේදනයේ සිංහල , දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වෙනු ඇත.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

2024 දෙසැම්බර් මස16 වැනි දින
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

කුමුදිනී. එස්. ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

ආදර්ශ අයැදුම්පත්‍රය

**මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ජනපද නිලධාරී III ශ්‍රේණිය සඳහා වන විවෘත බඳවා ගැනීම - 2024**

විභාග අංකය :- [ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- [ ] (සිංහල - S , දෙමළ - T, ඉංග්‍රීසි - E)

(අදාළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ)

01. 1.1 මුලකුරු සමඟ නම :- ..........................................................................................
Mr./Mrs./Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා :- SILVA A.B.C.D.)

1.2 මුලකුරු සමඟ නම :-..........................................................................................
මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-

..........................................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්)

..........................................................................................

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්):-

..........................................................................................

2.2 විද්‍යුත් තැපැල් ලිපිනය..........................................................................................

2.3 ජාතික හැඳුනුම්පත් අංකය :- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

2.4 ස්ත්‍රී/පුරුෂ භාවය 0 -පුරුෂ , 1- ස්ත්‍රී [ ]

2.5 විවාහක/අවිවාහක බව :- අවිවාහක - 1 විවාහක - 2 [ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

03. 3.1 උපන් දිනය :- [Y][Y][Y][Y][M][M][D][D]

3.2 අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2025.01.10) වයස :- අවු : ..... මාස : .....දින : .......

3.3 දුරකථන අංකය ජංගම:- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ] ස්ථාවර:- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]
(විභාගය සම්බන්ධව දැනුම්දීම සඳහා)

04. අයැදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:-..........................................................................

| ඡන්දහිමි නාම ලේඛනයට අනුව පදිංචිය | 2021 | 2022 | 2023 |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාශය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාශය | | | |
| ග්‍රාම නිලධාරී කොට්ඨාශය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

05.අධ්‍යාපන සුදුසුකම්:-

05.1 අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය:-

වසර: .................. විභාග අංකය: ............................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

05.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය:-

වසර:-................ විභාග අංකය:-...............................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

06. වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම්:- (වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන ලේඛන වල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | පාඨමාලාවේ කාල සීමාව | NVQ මට්ටම | NVQ සහතිකපත් අංකය | සහතිකපත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

07. වෙනත් සුදුසුකම්:- ......................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................

08. දැනටමත් රජයේ/ පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින්නේ නම්,

8.1 දැනට දරන තනතුර:- ...........................................................................................................

8.2 සේවා ස්ථානයේ නම සහ ලිපිනය:-.............................................................................................

...........................................................................................................................................................

8.3 එම තනතුරට පත්වීමේ දිනය:- .................................................................................................

8.4 සේවා කාලය:- ............................................................................................................................

8.5 එම තනතුර ස්ථිරද/ තාවකාලිකද, අනියම්ද යන්න:- ...................................................................

09. ඔබ යම් ආබාධයකින් පෙලෙන්නේද? ..........................................

ඔව් නම් ඒ පිළිබඳ තොරතුරු ...........................................................................................................

...........................................................................................................................................................

...........................................................................................................................................................

10. විභාග ගාස්තු රු: 600/- ගෙවීම පිළිබඳ තොරතුරු

i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම :-......................................................

ii. දිනය :- ..........................................................................................

iii. කුවිතාන්සි අංකය :- ..........................................................................................

| |
|---|
| මුදල් ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙම කොටුව තුළ අලවන්න<br>( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ) |

11. ඔබ කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේද ?.........................................................................

"ඔව්" නම් විස්තර දක්වන්න. :- ..........................................................................................................

අයැදුම්කරුගේ ප්‍රකාශය

12. මෙම අයැදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

.................................. ..............................................

දිනය අයැදුම්කරුගේ අත්සන

13. අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................................................................... මහතා/ මහත්මිය/ මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිටදී ............ දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

.................................. ..............................................

දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන (නිලමුද්‍රාව සමඟ)

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම:- ..........................................................

තනතුර:- ………………………………………………

ලිපිනය:- ………………………………………………

14. අයැදුම්කරු රජයේ / පළාත් රාජ්‍ය සේවාවේ නියුතු අයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

....................................................................... මහතා/ මහත්මිය/ මෙනෙවියගේ අයැදුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු /ඇය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ..................................................................... වශයෙන් ස්ථිර / තාවකාලික/ අනියම් පදනමින් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා ඔහු / ඇය තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

.................................. ..............................................

දිනය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන (නිල මුද්‍රාව සහිතව)